**වත්තේගම නගර සභාව - 2020**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

වත්තේගම නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.75,485 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව කර්මාන්ත ණයහිමියන් සඳහා ගෙවිය යුතු වටිනාකම කර්මාන්ත 03 ක රු.773,506 ක් වැඩියෙන් හා කර්මාන්ත 02 ක රු.84,580 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | සභාව සතු භෞතිකව නොතිබුණු රු.423,990 ක් වටිනා වාහන 04 ක් ගිණුම්ගත කර තිබුණි. | මේ සඳහා කමිටුවක් පත් කර ලබා දෙන වාර්තාවට අනුව කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඈ) | සේවක ණය ශේෂය එකතුව රු.45,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම අනුව සොයා බලා ඉදිරියේදි කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 ට අදාළව මූල්‍ය ප්‍රකාශනවල එකතු වටිනාකම රු.21,398,540 ක් වූ අතර, අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.22,373,647 ක් වූයෙන් රු.1,657,445 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.2,603,238 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අදාළ උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විගණනයට අවශ්‍ය සියලු සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,055,072 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,398,117 ක් විය. එයට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6 කින් වැඩි වී තිබීම බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ රු.3,866,457 ක හිඟ ශේෂය තුළ වූ වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රජයේ ආයතනවලින් අයවිය යුතු රු.337,556 ක් හා පෞද්ගලික බදුකරුවන්ගෙන් අයවිය යුතු රු.1,965,748 ක් අයකර ගෙන නොතිබුණි. | කොරොනා වසංගතය හේතුවෙන් ජංගම සේවාවන් හා දේපල තහනම් කිරීම් පැවැත්වීමට අපහසු තත්ත්වයක් උද්ගත විය. රාජ්‍ය ආයතනවලින් අය විය යුතු මුදල සම්බන්ධයෙන්ද අදාළ ආයතනයන් දැනටමත් දැනුවත් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කඩ කුලී | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 05 කින් අය විය යුතු රු.117,446 ක කඩ කුලී අයකර ගෙන නොතිබුණි. | කඩ හිමියන් දැනුවත් කර ලිපි යවා අයකර ගැනිමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | දීර්ඝකාලීනව බදු දීමට කටයුතු කර තිබූ සභාව සතු කඩ කාමර 30 ක් සඳහා 2017 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව තක්සේරු කුලිය අය කරමින් පැවති අතර, නව තක්සේරුව ඇතුළත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් මඟින් සන්තකය ආපසු ලබා ගැනීමේ ක්‍රියා පිළිවෙත මගින් ඉදිරි කටයුතු කර මෙය නිවැරදි කිරීමට අපේක්ෂා කරමි. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම්, ජල ගාස්තු, පෙර ගෙවුම් හා කර්මාන්ත ණය ගැති ශේෂවල එකතුව රු.17,870,146 ක් වූ අතර ඒ තුළ රු.6,706,213 ක් වූ වසර 1 ට වැඩි ගිණුම් ශේෂ ඇතුළත්ව තිබුණි. | කෝවිඩ් වසංගතය පැමිණීම තුළින් මෙම හිඟ ආදායම් අයකර ගැනීම ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇති බව දන්වමි. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමියන් රු.9,311,642 ක්, විවිධ ණය හිමියන් රු.216,460 ක් හා රජයේ ආයතනවලට ගෙවිය යුතු රු.750,378 ක් ලෙස එකතුව රු.10,278,480 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබූ අතර ඒ තුළ රු.117,437 ක වසර 01 ට වැඩි ගිණුම් ශේෂ ඇතුළත්ව තිබුණි. | ඉදිරි වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොපමාව පියවීමට කටයුතු කළයුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් අක්කර 8 1/2 ක වපසරියක් ඇති ඉඩමක 1980 දී ඉදිකර තිබූ නිවාස 30 කින් සභාවට අයවිය යුතු රු.1,037,309 ක් විධිමත්ව අයකරගෙන මුදල් ගෙවූ ඉඩම් හිමියන් හට ඔප්පු ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කර ඇති අතර එම අනුමැතිය ලද පසු හිමිකම් ඔප්පු ලබා දීමේ කටයුතු අවසන් කරමි. | සභාවට අයවිය යුතු මුදල් විධිමත්ව අය කර ගැනීමටත්, ඔප්පු ලබා දී නොමැති ඉඩම් හිමියන්ට කඩිනමින් ඔප්පු ලබා දීමටත් කටයුතු කළ යුතු වීම. |